# විශ්‍රාම වැටුප් නීතිය

ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම ඇති කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ශ්‍රී ලංකාවේ පමණක් නොව ලෝකයේම මෙබඳු ගොවි සහන වැඩ පිළිවෙලක් පිළිබඳ පළමුවන අත්දැකීම බව කිව හැක. රජයේ සේවකයින්ට, කම්කරුවන්ට, පුද්ගලික හා සංස්ථා සේවකයන්ට, ගැලපෙන විශ්‍රාම වැටුප් හා සමාජ සංරක්ෂණ ක්‍රම අප රටේ දැනටද ක්‍රියාත්මක වේ. මීට අමතරව විවිධ ජීවන වෘත්තීන්හි නියැලෙන අයට දායක විය හැකි රක්ෂණ ක්‍රම ශ්‍රී ලංකාවට අලුත් දේ නොවේ.

පහත සඳහන් කරුණු හේතු වෙන්, ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ අංග සම්පූර්ණ විමර්ශණයක් කිරීමට තවමත් නිසි කල නොවේ.

(1) ලිපිය සකසන අවස්ථාව වන විටත්, ගොවි විශ්‍රාම වැටුප් පිළිබඳ නීතිය කෙටුම්පත් අවස්ථාවේ පැවතීම. මෙය නීතියක් ලෙස සැකසෙන විටදී යම් යම් වෙනස්කම් සිදුවීමට ඉඩ ඇත.

(2) පනත යටතේ නියමිත නියෝග ඈතවීම, පාර්ලිමේන්තුවේ පනත් කෙටම්පත සම්මත වන තුරු පමා වීම.

එහෙත්, ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයේ මූලික ලක්ෂණ ගැන සාකච්ඡා කිරීමට අප අධෛර්යය විය යුතු නැති අතර, පනත් කෙටුම්පත ඇසුරින් එහි වැදගත් නීතිමය තත්ත්වයන් කීපයක් විස්තර කිරීම මෙම ලිපියේ අරමුණ වේ.

කෙටුම්පතේ 11 වන වගන්තිය අනුව, යෝජනා ක්‍රමය මෙහෙයවනු ලැබිය යුත්තේ කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය විසින් ය. තවද, ඒ සඳහා අවශ්‍ය බලතල කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය වෙත පවරා ඇත.

කෙටුම්පතේ 3 වන වගන්තිය අනුව, ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වන ප්‍රදේශ, යෝජනා ක්‍රමයට දායක විය හැකි ගොවීන් වර්ග සහ ඔවුන්ගේ සුදුසුකම් ගැසට් නිවේදනයකින් නියම කරලීමට අමාත්‍යතුමාට බලය පවරා ඇත. මෙම ගණයට ඇතුළු වන, වයස අවුරුදු 18-59 අතර ගොවීන්ට යෝජනා ක්‍රමයට බැඳීමට හිමිකම් ඇත.

ලලිත් ජයසූරිය විසිනි

යෝජනා ක්‍රමයෙන් ප්‍රතිලාභ වර්ග හතරක් සාමාජිකයින්ට හිමිවන බව පෙනේ.

1. විශ්‍රාම වැටුපක්.
2. ස්ථිර අර්ධ දුබලතාවයක් සිදුවූ විට, එක්වර ගෙවන පාරිතෝෂිකයක් හෝ විශ්‍රාම වැටුපක්.
3. ස්ථිර පූර්ණ අබලතාවයක් වූ විට, එක්වර ගෙවන මුදල පාරිතෝෂිකයක් හෝ කාල පරිච්ඡේද අනුව දීමනාවක්.
4. මරණ පාරිතෝෂිකයක්.

අදාළ ගෙවීම් නියම කිරීමේදී වෙනත් කරුණු අතර, දායකත්වයේ කාලසීමාව, දායකයාගේ වයස සහ ඔහු විසින් ගෙවන ලද මුදල් ප්‍රමාණය ආදිය පදනම් කරගනු ඇත.

වයස අවුරුදු 60 සපිරුණු දායකයෙකුට තම විශ්‍රාම වැටුපෙන් ප්‍රතිලාභ ලැබීම ඇරඹිය හැකි අතර, වයස පනස් පහ වූ පසු දායක මුදල් ගෙවීම ආරම්භ කළ අයෙක් නම්, මුල් වාරිකය ගෙවීමෙන් වර්ෂ 5 ක් සම්පූර්ණ වූ විටදී ඔහුගේ විශ්‍රාම වැටුප් දීමනා ලැබීම ඇරඹේ.

උදා :-වයස අවුරුදු 58 ක්වූ ගොවි මහතෙක් යෝජනා ක්‍රමයට දායක වූයේ නම් ඔහුගේ විශ්‍රාම වැටුප් හිමිකම් ලබා ගත හැක්කේ අවුරුදු 63 සම්පූර්ණ වූ විටය.

කෙටුම්පතේ 8 සහ 9 වගන්ති මගින් යම් යම් හේතූ උඩ අතරමගදී යෝජනා ක්‍රමයෙන් ඉවත්වන අයගේ අයිතිවාසිකම් රැකදීමට ප්‍රතිපාදන සලසා ඇත.

දහවන වගන්තිය මගින්, වැදගත් රැකවරණයක් කෙටුම්පතට එක්කර ඇත. එනම්, නිශ්චිත වයසට එළඹීමට පෙර මරණයට පත්වන දායකයෙකුගේ භාර්යාවට හෝ ස්වාමි පුරුෂයාට මරණ පාරිතෝෂිකයක් ගෙවීමට ප්‍රතිපාදන සලසා ඇත. යම්හෙයකින්, එනි භාර්යාවක හෝ ස්වාමි පුරුෂයකු නොමැතිනම්, කෙටුම්පතේ උපලේඛනයේ සඳහන් ප්‍රමුඛතා ලේඛණය අනුව හිමිකරු තෝරයි. මෙවැනි ලේ ඥාතීන් එක් අයෙක් පමණක් මරණ පාරිතෝෂිකය ලැබීමට හිමිකරු වන අතර, එවැන්නන් වැඩි ණනක් සිටින විටදී, ඔවුන් අතරින් වයසින් වැඩි තැනැත්තාට ප්‍රමුඛත්වය දිය යුතු ය.

**ප්‍රමුඛතා උපලේඛණය :**

(1) පුත්‍රයෝ
(2) දියණියෝ
(3) මුනුබුරෝ
(4) මිනිබිරියෝ
(5) පියා
(6) මව
(7) සහෝදරයෝ
(8) සහෝදරියෝ
(9) පියාගේ හෝ මවගේ සහෝදරයෝ
(10) පියාගේ හෝ මවගේ සහොදරියෝ
(11) බෑණලා
(12) ලේලිලා

යෝජනා ක්‍රමයට දායක වන්නාවූ අයකු විසින්, තමා වෙත ලැබෙන ප්‍රදානයන් පිළිබඳ කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලයෙන් දෙනු ලබන තීරණයක් ඇන අමාත්‍යාංශයේ ලේකම්වරයාට අභියාචනා කරනු ලැබීමේ අයිතිය 18 වන වගන්තිය මගින් තහවුරු කර ඇත.

19 වන වගන්තියෙන් දායකයින්ගේ රැකවරණය වඩාත් තහවුරු කරන නීතිමය ප්‍රතිපාදනයක් සැලසී ඇත. එනම්, විශ්‍රාම වැටුප, පාරිතෝෂිකය හෝ දීමනාව අන්සතු කිරීම හෝ පවරා දීම, තහනම් හා බල රහිත කර ඇති අතර, මෙම යෝජනා ක්‍රමයෙන් දායකයෙකුට ලැබෙන යම් ප්‍රතිලාභයක් අධිකරණයක් මගින් තහනම් කිරීම හෝ ණයට කපා ගැනීම ප්‍රකාශිතවම තහනම් කර ඇත.

ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය පාලනය කිරීම සඳහා අවශ්‍ය උපදේශක කාරක සභාවක් පත්වන අතර, කෘෂිරක්ෂණ මණ්ඩලය, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, ශ්‍රී ලංකා මහ බැංකුව හා කම්කරු දෙපාර්තමේන්තු යන ආයතන නියෝජනය කරන සාමාජිකයින්ගෙන්ද අදාළ තවත් අයතන කිහිපයකින් නම් කළ සාමාජිකයින් කීප දෙනෙකුගෙන්ද, එම සභාව සමන්විත වේ.